# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2317/78 - 2023 පෙබරවාරි මස 02 වැනි බ්‍රහස්පතින්දා - **2023.02.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : KUDS/LND/01/ACQ/22.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4/3/8/2017/PC/412.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/ පරවශතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

මිල්ලවිටිය සමාධි පෙදෙස මාර්ගය සංවර්ධනය සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාවට ඉඩම් අත්කර ගැනීම.

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 158/ඒ මිල්ලවිටිය ග්‍රාම නිලධාරි වසමට අයත් මිල්ලවිටිය ගමේ පිහිටි රත්නපුර මිනින්දෝරු අධිකාරිගේ අ.ග.පි. 359 හා අති 16 පත්‍ර 18 හි ලොට් 429, 430 හා 431 දරන ප්‍රමාණයෙන් හෙක්. 0.0003, 0.0006 හා 0.0012 ක් වන ඉඩම් කොටස්.

01. **කැබලි අංකය 429**
ඉඩමේ නම: අස්වැද්දුමහේනේවත්ත, අස්වැද්දුමහේන කිරිගලඑස්ටේට්, දොඩම්ගහහේනවත්ත; හිමිකම් කියන්නා: කටුලන්දලාගේ සීතා දයාසිරි, සමාධි පෙදෙස, මිල්ලවිටිය, කුරුවිට; ප්‍රමාණය හෙක්. 0.0003.

02. **කැබලි අංකය 430**
ඉඩමේ නම: අස්වැද්දුමහේනේවත්ත, අස්වැද්දුමහේන කිරිගලඑස්ටේට්, දොඩම්ගහහේනවත්ත; හිමිකම් කියන්නා: අසත් පේඩිගේ අශෝකා රාජනී, සමාධි පෙදෙස, මිල්ලවිටිය, කුරුවිට; ප්‍රමාණය හෙක්. 0.0006.

03. **කැබලි අංකය 431**
ඉඩමේ නම: අස්වැද්දුමහේනේවත්ත, අස්වැද්දුමහේන කිරිගලඑස්ටේට්, දොඩම්ගහහේනවත්ත; හිමිකම් කියන්නා: හබුරුගල විතානගේ දොන් ලින්ටන් දයාලාල් අබේවික්‍රම, සමාධි පෙදෙස, මිල්ලවිටිය, කුරුවිට; ප්‍රමාණය හෙක්. 0.0012.

ඉහත සඳහන් ඉඩමේ/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 මාර්තු මස 15 දින පෙ.ව. 10.00ට කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද 2023 මාර්තු මස 08 දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත් වන්දි මුදල හා එය ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

බී. එම්. බී. එම්. ඒ. බටුගෙදර,
ප්‍රාදේශීය ලේකම්,
කුරුවිට.

2023.01.27 වැනි දින,
කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 02 - 0020



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*